ශ්‍රේණිය - 09 ශ්‍රේණිය


විෂය - බුද්ධ ධර්මය

වාරය - II වාරය

පාඩම - 11 වැනි පාඩම

ඒකකය - බුදු බව පැතූ බලංගොඩ මහනායක හාමුදුරුවෝ .





තුන් හෙළේ මහ සඟ රජාණනි
තුන් පිටකයේ වෙස රදාණනි
තුන් කලම දුටු සෘෂිවරාණනි
බවුන් වැඩූ මහ යෝගියාණනි

තුඹුල දැන යුත් මහා පඬිවර
ගැඹුර ගුණයෙන් සදිසි සමුදුර
බලංගොඩ ආනන්ද මෛත්‍රෙය
පවර සඟරළුනේ.......
ඉර හඳ ද දන ගසා නමදී
ඔබට මේ දෙරණෝ..........

ඉහත ගී පද වලින් කියවෙනුයේ අප රටේ වැඩ සිටි සුපේෂල ශික්ෂාකාමී වියත් දේශ දේශාන්තරයන්හි බහු මානයට පත් බුදු සසුනට මහ මෙහෙවරක් සිදු කළ අති පූජ්‍ය බලංගොඩ ආනන්ද මෛත්‍රෙය මහා නායක මාහිමිපාණන් වහන්සේ පිළිබදවය.

උපත - 1896 අගෝස්තු 23 වන දින බලංගොඩ කිරිදිගලදීය

ගිහි නම - විලියම්

මවගේ නම - හීන් මැණිකේ

පියාගේ නම - නරංගොඩ ආරච්චිගේ මෙතියස් හාමි නොහොත් මද්දුහාමි උක්වත්තගේ

මව මියයෑමෙන් අනතුරුව මෙම දරුවා රැකබලා ගන්නට කටයුතු කළේ යසෝහාමි ලොකු අම්මාය.

- මූලික අධ්‍යාපනය - බලංගොඩ කිරිදිගල කතෝලික විදුහල

බලංගොඩ රජයේ කුමාර විදුහල

මේ කාලයේ වලිසිංහ හරිච්චන්ද්‍ර තුමා බලංගොඩට පැමිණි අවස්ථාවේ කළ දේශනයක් අසා ජාතිකත්වය පිළිබඳ හැඟීමක් ඇති විය.

- පැවිද්ද -
  - 1911 මාර්තු 02 වන දින දෙනිහේනේ සීලානන්ද තෙරුන් වහන්සේගේ ආචාර්යත්වයෙන් පැවිදි බිමට පත් විය. පැවිදි නම ලෙස බලංගොඩ සරණ ගවේශී යනුවෙන් නම් තබන ලදී.
  - 1916 දී ජූලි 14 බලංගොඩ ඕලු ගග උදකුක්ඛේප සීමා මාලයේදී උපසම්පදාව ලැබූහ.

- උපසම්පාදවේ වසර දෙකක් ගිය තැන මුල් නම ඉවත් කොට බලංගොඩ ආනන්ද මෛත්‍රෙය නම භාවිතයට ගත්හ.

- පිරිවෙනකට නොගිය උන්වහන්සේ පාලි, සංස්කෘත, සිංහල, ඉංග්‍රීසි ඉගෙන ගත්තේ තම ගුරු හිමියන් වහන්සේ වෙතිනි.

- ඉංග්‍රීසි භාෂා දැනුම දියුණු කර ගැනීම සඳහා කොළඹ ආනන්ද විද්‍යාලයට 1919 වැඩම කළහ. 1922 දී එහි ගුරුවරයෙකු බවට පත් විය.

- නාලන්දා විද්‍යාලය (වසර දෙකකි) “අපදාන සෝභිනී ප්‍රඥා” යන ආදර්ශ පාඨය හා එම විද්‍යාලයේ නමත් උන්වහන්සේගේ උපදෙස් පරිදි නිර්මාණය වූවකි.

## විදේශීය ධර්ම දූත සේවය -

- 1926 දී ඉන්දියාවේ කැලිකට් නගරයට වැඩම කරවිය. භාරතයට පමණක් 36 වතාවක් වැඩම කළහ.
- උන්වහනසේ සතුව සිංහල, පාලි, සංස්කෘත යන පෙර දිග භාෂා මෙන්ම ඉංග්‍රීසි, ප්‍රංශ, ලතින් අපර දිග භාෂා පිළිබඳ දැනුමද පැවතුණි.
- උන්වහන්සේ ධර්මපාල තුමාගේ අඩි පාරේ යමින් ජාතික මෙහෙවරටද දායකත්වය දැක්වීය.
- විදේශ ධර්ම ප්‍රචාරණ කටයුතුවලට සූදානම් වූ නමුත් රටේ මහත්තයාගේ ඉල්ලීම මත එම ගමන නවතා 1935 දී ආනන්ද විද්‍යාලයෙන් ඉවත් වී බගංගොඩ ධම්මානන්ද පිරිවෙනට වැඩම කළහ.
- ශිෂ්‍ය භික්ෂූන්ට හා දුප්පත් දරුවන් වෙනුවෙන් ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම සඳහා 1945 ජූලි 05 ශ්‍රී ධම්මානන්ද විද්‍යාලය නමින් පාසලක් ආරම්භ කරන ලදී.
- වත්මන් බලංගොඩ මධ්‍ය මහා විද්‍යාලය නමින් හඳුන්වන්නේ එම විද්‍යාලයයි.

උන්වහන්සේ දේශනයේ මෙන්ම ලේඛනයෙහි සමත්කම් දැක් වූහ. ඒදා අන්‍ය ආගමිකයන් විසින් බෞද්ධයන් විවේචනය කොට පුවත්පත් ආරම්භ කළ අවස්ථාවේ ඊට පිළිතුරු ලබා දීම සදහා ශ්‍රී බුද්ධ රශ්මි නමින් පුවත් පතක් ආරම්භ කරමින් එහි ආරම්භ සංස්කාරවරයා වශයෙන් කටයුතු කරන ලදී. මෙම කාලයේදීම මොරටුව ප්‍රදේශයේ මාස 3ක් මුළුල්ලේ ගෙන ගිය වාදයකට උන්වහන්සේ වැඩම කරමින් ජයග්‍රහනය කර අන්‍ය ආගමික පවුල් 63 ක් බුදු දහමට හරවා ගැනීමට සමත් විය.

උන්වහනසේ විසින් රචිත ඒක් ග්‍රන්ථයක් නම් 1928 රචනා වූ බුද්ධ චරිතයයි. මෙම ග්‍රන්ථයේ පිටපත් මේ වන විට ලක්ෂයට වඩා මුද්‍රණය කර ඇත. පරිවර්ථන කෘති ප්‍රමාණය 80 ට ආසන්නය. පුවත් පත් සගරා ආදිය ලියූ ලිපි සංඛ්‍යාව ගණන් කළ නොහැකිය.

1954 වර්ෂයේ සබරගමුව සද්ධර්මවංශ නිකාය මගින් සංඝනායක පදවිය පිරි නැමීමෙන් පසුව එම නිකායේ මහ නායක ධූරයට පත් විය.

1954 දී බුරුමයේ ඡට්ඨ සංඝායනාවේදී එහි ප්‍රධාන උත්තරීතර අවසාන සංශෝධන මණ්ඩලයට තෝරා පත් කර ගැනීම සිදු විය.

අට්ඨ කතා සංඝායනාවේදී ප්‍රධාන සභාපති ධූරයට පත් විය. විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ බෞද්ධ අංශයේ මහාචාර්ය ධූරයට පසුව පත් විය. ඉන් පසුව එම විශ්ව විද්‍යාලයේම උපකුලපති ධූරයට පත් විය.

උන්වහන්සේ ලැබූ ගෞරව නාම අතර සාහිත්‍ය ශූරී, අග්‍ර මහා පණ්ඩිත, සාහිත්‍ය චක්‍රවර්තී, අභිධජ මහා රට්ඨගුරු ආදිය වැදගත් වෙයි. අමරපුර සංඝ සභාවේ සභාපති පදවිය 10 වසරක් දැරූ අතර මහා නායක පදවිය පිරි නැමූ අවස්ථාවේ එය අනතිමානීම ප්‍රතික්ෂේප කරන ලදී.



“මතු බුදුවන ආනන්ද මෛත්‍රෙය නාහිමි” යනුවෙන් ප්‍රකටව සිටි අප කථානායකයාණෝ අවුරුදු 102ක් වැඩ සිටිමින් 1998 අගෝස්තු 23 සියලු සංස්කාර ධර්මයන් අනිත්‍ය බව පසක් කරමින් අපවත් වූහ.

අපගේ දියුනුව පවතින්නේ අපසතු සම්පත් ප්‍රමාණය මත නොව උත්සාහය මත බව උන්වහන්සේ අපට පෙන්වා දුන් සේක. පාසැල් දරුවන් හැටියට කොතරම් කම්කටොලු දුෂ්කරතා තිබුනත් ඒවා ජය ගෙන දිරියට යාමෙන් අනාගත ජීවිතය උතුම් ඵල නෙලා ගතහැකි බව උනවහන්සේගේ චරිතයෙන් අපට පෙන්වා දෙයි.

# ක්‍රියාකාරකම්

1. ආනන්ද මෛත්‍රෙය මහා නාහිමියන්ගේ උපන්දිනය සහ දෙමාපියන්ගේ නම් සඳහන් කරන්න.
2. උන්වහන්සේ සේවය කළ පාසල් දෙකක් නම් කරන්න.
3. උන් වහන්සේ ඉගෙන ගත් පෙර දිග හා අපර දිග භාෂාවන් කවරේද? ඒ මොනවාද?
4. උන්වහන්සේ වෙත ලැබුනු ගෞරව නාම කිහිපයක් දක්වන්න.
5. උන්වහන්සේ උපකුලපති දූරය දැරූ විශ්ව විද්‍යාලය නම් කරන්න.

# පිළිතුරු

1. 1896 අගෝස්තු 23
   මවගේ නම - හීන් මැණිකේ
   පියාගේ නම - නරංගොඩ ආරච්චිගේ මෙතියස් හාමි නොහොත් මද්දුහාමි උක්වත්තගේ
2. ආනන්ද විද්‍යාලය නාලන්දා විද්‍යාලය
3. පෙරදිග භාෂා - සිංහල, පාලි, සංස්කෘත
   අපර දිග භාෂා - ඉංග්‍රීසි, ප්‍රංශ, ලතින්
4. සාහිත්‍ය ශූරී, අග්ග්‍ර මහා පණ්ඩිත, සාහිත්‍ය චක්‍රවර්තී, අභිධජ මහා රට්ඨගුරු
5. විද්‍යෝදය විශ්ව විද්‍යාලය


තෙරුවන් සරණයි